# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2135/13 - 2019 අගෝස්තු මස 05 වැනි සඳුදා - 2019.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනත

1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව කොළඹ වරාය නගරය ඉඩම කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොටසක් ලෙසට ඇතුළත් කළ බවට සිදුකරන නිවේදනය

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය වජිර අබේවර්ධන වන මම, උක්ත කරුණ සම්බන්ධව 2019 ජූලි මස 23 වැනි දින සිදු කරන ලද පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත කර ගැනීමට අනුව මෙහි උපලේඛනයේ විස්තර කර ඇති 'වරාය නගරය කොළඹ' යනුවෙන් හඳුන්වන ලබන ගොඩකරන ලද භූමි ප්‍රදේශය 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශය සහ සීමා තුළට ඇතුළත් කිරීම මගින්, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ සීමා වෙනස් කිරීම සහ එම ගොඩකරන ලද භූමි ප්‍රදේශය, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එකතු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

වජිර අබේවර්ධන,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2019 අගෝස්තු මස 02 වැනි දින.

### උපලේඛනය

මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2019.06.11 දිනැති අංක CO/DSO/2019/370 දරන අනුරේඛනයේ නිරූපණයකර ඇති, බස්නාහිර පළාතේ, කොළඹ, මෙහි පහත දැක්වෙන සම්බන්ධ කිරීමේ ලක්ෂ්‍යයන්හි පිහිටා ඇති සහ කැබලි අංක 2 සිට කැබලි 7 ලෙස සලකුණු කොට ඇති හෙක්ටයාර් 446.6153කින් සමන්විත 'වරාය නගර කොළඹ' යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ භූමි ප්‍රදේශය :-

1A - G 30670— 22 (2019/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** (සම්බන්ධිතයි)

| *සම්බන්ධ වන ලක්ෂ්‍යය- කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම්* | *නැගෙනහිර බණ්ඩාංක* | *උතුරු බණ්ඩාංක* |
|---|---|---|
| උතුරින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 396913.476 | 492847.764 |
| දකුණින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 397077.037 | 492290.222 |

(සමුද්දේශ බණ්ඩාංක පද්ධතිය : Sri Lanka Grid 1999)

**1. කැබලි අංක 02 : ප්‍රමාණය : හෙක්. 155.8376**

*උතුරට* : කැබලි අංක 6 සහ 1, කොළඹ වරාය සහ චෛත්‍යය පාර ;
*නැගෙනහිරට* : කැබලි අංක 1, කොළඹ වරාය, චෛත්‍යය පාර, ඉන්දියානු සාගරය සහ කැබලි අංක 07 ;
*දකුණට* : ඉන්දියානු සාගරය, කැබලි අංක 7, 6 සහ 3 ;
*බටහිරට* : කැබලි අංක 6, 3 සහ 6.

**2. කැබලි අංක 03 : ප්‍රමාණය : හෙක්. 15.0933**

*උතුරට* : කැබලි අංක 2 ;
*නැගෙනහිරට* : කැබලි අංක 2 සහ 6 ;
*දකුණට* : කැබලි අංක 6 සහ 4 ;
*බටහිරට* : කැබලි අංක 4 සහ 6.

**3. කැබලි අංක 04 : ප්‍රමාණය : හෙක්. 113.5311**

*උතුරට* : කැබලි අංක 6 සහ 3 ;
*නැගෙනහිරට* : කැබලි අංක 3 සහ 6 ;
*දකුණට* : කැබලි අංක 6, 5 සහ 6 ;
*බටහිරට* : කැබලි අංක 6, 5 සහ 6.

**4. කැබලි අංක 05 : ප්‍රමාණය : හෙක්. 14.7856**

*උතුරට* : කැබලි අංක 6 සහ 4 ;
*නැගෙනහිරට* : කැබලි අංක 6 සහ 4 ;
*දකුණට* : කැබලි අංක 6 ;
*බටහිරට* : කැබලි අංක 6.

**5. කැබලි අංක 06 : ප්‍රමාණය : හෙක්. 101.1038**

*උතුරට* : කැබලි අංක 7, 1, 2, 3, 4, 5, 4, 3 සහ 2 ;
*නැගෙනහිරට* : කැබලි අංක 1, 2, 3, 4, 5, 2 සහ 7 ;
*දකුණට* : කැබලි අංක 2 සහ 7 ;
*බටහිරට* : කැබලි අංක 2 සහ 7.

**6. කැබලි අංක 07 : ප්‍රමාණය : හෙක්. 46.2639**

*උතුරට* : ඉන්දියානු සාගරය, කැබලි අංක 1, 6 සහ 2 ;
*නැගෙනහිරට* : කැබලි අංක 1, 6 සහ 2 සහ ඉන්දියානු සාගරය ;
*දකුණට* : ඉන්දියානු සාගරය ;
*බටහිරට* : ඉන්දියානු සාගරය.

08 - 718

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.